බස්නාහිර පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවේ වෛද්‍ය කර්මය සඳහා වූ පරිපූරක වෘත්තීන්ගේ සේවා ගණයේ MT – 08 විශේෂ ශ්‍රේණියේ බඳවා ගැනීමේ පරිපාටිය.

25 AUG 2022

01. සම්බන්ධ වන ආයතන :

1.1 දෙපාර්තමේන්තුව : බස්නාහිර පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව
යොමු අංකය : WP/ES/5/1/2 දිනය : 2021.10.18

1.2 අමාත්‍යාංශය : සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුභසාධන පරිවාස හා ළමාරක්ෂක සේවා, කාන්තා කටයුතු සහ සභා කටයුතු අමාත්‍යාංශය(බ.ප)

යොමු අංකය : WPH/A5/5/12 දිනය : 2021.11.02

1.3 කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් තනතුර අනුමත කිරීම :
යොමු අංකය : DMS/WP/FCR/Health/2018 දිනය : 2019.01.30

1.4 ප්‍රධාන ලේකම් (බ.ප) නිර්දේශය :
යොමු අංකය : CSWP/PTR/23-3/FI/9 දිනය : 2022.01.31

1.5 ජාතික වැටුප් කොමිෂන් සභාවේ නිර්දේශය :

යොමු අංකය : දිනය :

1.6 බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නිර්දේශය :

යොමු අංකය : WPC/PSC/MNP/01/04/199 දිනය : 2022.07.05

1.7 ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය :

යොමු අංකය : දිනය :

02. පත් කිරීමේ බලධාරියා - බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව
ක්‍රියාත්මක වන දිනය - ගරු ආණ්ඩුකාරතුමා අනුමත කළ දින සිට ක්‍රියාත්මක වේ.

03. සේවා ගණය පිළිබඳ විස්තර :

3.1 සේවා ගණය - වෛද්‍ය කර්මය සඳහා වූ පරිපූරක වෘත්තීන්ගේ සේවාව
3.2 ශ්‍රේණි - විශේෂ ශ්‍රේණිය.
3.3 පැවරෙන කාර්ය භාරය පිළිබඳ පොදු නිර්වචනය :-

වෛද්‍ය කර්මය සඳහා වූ පරිපූරක වෘත්තීන්ගේ සේවාවට අයත් වෛද්‍ය රසායනාගාර කාර්මික විද්‍යාඥ, ඖෂධවේදී, විකිරණ ශිල්පී හා භෞත චිකිත්සක යන තනතුරු වලට අයත් සියළුම ශ්‍රේණිවල නිලධාරීන්ගේ කාර්යයන් අධීක්ෂණය, කළමනාකරණය, කාර්ය සාධන ඇගයීම, විනය පාලනය, පුහුණුව ලබාදීම හා රාජකාරි පිළිබඳ ප්‍රතිපත්ති සකස් කිරීම මගින් එක් එක් තනතුරට අදාළ කාර්යයන් උපරිම කාර්යක්ෂමතාවයකින් ලබාදීම තහවුරු කිරීම.

3.4. කාර්යයන් පැවරීම :-
තනතුරු පදනම්ව කාර්යයන් පැවරීමක් සිදු කරන අතර, මෙම සේවා ගණයට පැවරෙන කාර්යයන් අතුරින් ඕනෑම අධීක්ෂණ කාර්යයක් සේවයේ අවශ්‍යතාවය මත ජ්‍යෙෂ්ඨතාවය හා කුසලතාවය පදනම් කොට ගෙන ඕනෑම නිලධරයෙකුට දෙපාර්තමේන්තු ප්‍රධානියා/ආයතන ප්‍රධානියා විසින් පවරනු ලැබිය හැක.

04. තනතුරෙහි / තනතුරු වල ස්වභාවය - මෙම තනතුර ස්ථිර, විශ්‍රාම වැටුප් සහිතය.

සටහන -
විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳව රජය විසින් ඉදිරියේ දී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයට යටත් විය යුතුය.

ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.
යොමු අංකය : GOS/ADM/12/7/372
දිනය : 2022.08.09

05. වැටුප්

5.1 වැටුප් කේත අංකය - MT - 08 - 2016 (රා.ප.ච.03/ 2016 අනුව)

5.2 වැටුප් පරිමාණය: - රු.50,200 - 10 x 1345 - 08 x 1630 - රු. 76,690

5.3 සේවා ගණයට අදාල ශ්‍රේණි ක්‍රමය හා ශ්‍රේණි ක්‍රමයට අදාල මාසික වැටුප් පියවර:

| ශ්‍රේණිය | ආරම්භක වැටුප් පියවර | ආරම්භක වැටුප් තලය (රු.) |
|---|---|---|
| විශේෂ | පියවර 03 | රු.52,890/- |

06. සේවා ගණයට අයත් තනතුර/තනතුරු :

6.1 අනුමත තනතුරු නාම, අනුමත තනතුරු සංඛ්‍යාව, ඒවාට පැවරෙන කාර්යයන් : ඇමුණුම - 01 මගින් දක්වා ඇත.

6.2 ඒකාබද්ධ නිලධර සංඛ්‍යාව :

| | |
|---|---|
| විශේෂ ශ්‍රේණියේ වෛද්‍ය රසායනාගාර කාර්මික විද්‍යාඥ | 04 |
| විශේෂ ශ්‍රේණියේ ප්‍රාදේශීය වෛද්‍ය රසායනාගාර කාර්මික විද්‍යාඥ | 01 |
| විශේෂ ශ්‍රේණියේ ඖෂධවේදී | 06 |
| විශේෂ ශ්‍රේණියේ ප්‍රාදේශීය ඖෂධවේදී | 03 |
| විශේෂ ශ්‍රේණියේ විකිරණ ශිල්පී | 01 |
| විශේෂ ශ්‍රේණියේ භෞත චිකිත්සක | 01 |

07. බඳවා ගැනීමේ ක්‍රමය :

7.1 බඳවා ගන්නා ප්‍රතිශතයන් :

| ධාරාව | ප්‍රතිශතය |
|---|---|
| විවෘත | - |
| සීමිත | - |
| කුසලතා | 100% |

7.2 විවෘත බඳවා ගැනීම : අදාල නොවේ

7.3 සීමිත බඳවා ගැනීම : අදාල නොවේ

7.4 කුසලතා බඳවා ගැනීම

7:4:1 බඳවා ගන්නා ශ්‍රේණිය : විශේෂ ශ්‍රේණිය

7:4:2 සුදුසුකම් :

7:4:2:1 අධ්‍යාපන සුදුසුකම් : අදාල නොවේ.

7:4:2:2 වෘත්තීය සුදුසුකම් : අදාල නොවේ.

ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.
ගොනු අංකය : ශOS/ADM/12/7/372
දිනය : 2022.08.09

7:4:2:3 පළපුරුද්ද :

අදාල තනතුරෙහි I වන ශ්‍රේණියේ වසර පහ (05) ක් සපුරා ඇති නිලධාරියෙකු හෝ අධි ශ්‍රේණියේ නිලධාරියෙකු වීම සහ පූර්වාසන්න වසර පහක (05) කාල සීමාව තුළ සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති නිලධාරියෙකු වීම.

25 AUG 2022
Public Service Commission

| තනතුර | අදාල විශේෂ ශ්‍රේණියේ තනතුර |
|---|---|
| වෛද්‍ය රසායනාගාර කාර්මික විද්‍යාඥ | විශේෂ ශ්‍රේණිය වෛද්‍ය රසායනාගාර කාර්මික විද්‍යාඥ |
| වෛද්‍ය රසායනාගාර කාර්මික විද්‍යාඥ | විශේෂ ශ්‍රේණිය ප්‍රාදේශීය වෛද්‍ය රසායනාගාර කාර්මික විද්‍යාඥ |
| ඖෂධවේදී | විශේෂ ශ්‍රේණිය ඖෂධවේදී |
| ඖෂධවේදී | විශේෂ ශ්‍රේණිය ප්‍රාදේශීය ඖෂධවේදී |
| විකිරණ ශිල්පී | විශේෂ ශ්‍රේණිය විකිරණ ශිල්පී |
| භෞත චිකිත්සක | විශේෂ ශ්‍රේණියේ භෞත චිකිත්සක |

7.4.2.4 කායික සුදුසුකම් :

සෑම අපේක්ෂකයෙකුම බස්නාහිර පළාතේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

7.4.2.5 වෙනත් :

i. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.
ii. අයදුම්කරුවන් විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය.
iii. උසස් කිරීමේ දිනට පූර්වාසන්නතම වසර පහ (05) තුල සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබිය යුතුය.
iv. අනුමත කාර්ය සාධනය ඇගයීමේ පරිපාටිය අනුව බඳවාගැනීමේ දිනට පෙරාතුව වූ වසර පහ (05) තුල සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහල කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබිය යුතුය.
v. පළමුවන ශ්‍රේණියේ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත්වී තිබිය යුතුය.
vi. අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සුදුසුකම් සම්පූර්ණ කර තිබිය යුතු බවට සඳහන් කරනු ලබන දිනට සියළු සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය. එමෙන්ම, අයදුම්කරුවන් විසින් සුදුසුකම් සනාථ කිරීම සඳහා අදාළ සහතිකවල පිටපත් අයදුම් පත්‍රය සමඟ ඉදිරිපත් කල යුතුය.

7.4.3 වයස: අදාළ නොවේ

7.4.4 බඳවා ගැනීමේ ක්‍රමය:

තනතුරුවල පවතින පුරප්පාඩු අනුව බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලැබූ අයදුම්පත් කැඳවීමේ නිවේදනයට අනුව අයදුම්පත් කැඳවා සුදුසුකම් පරීක්ෂා කිරීම සඳහා එම කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් පවත්වා ඉහලම ලකුණු ලැබූවන්ගේ ලකුණුවල කුසලතා අනුපිළිවෙල හා පුරප්පාඩු අනුව බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත් කරනු ලැබේ.අධි ශ්‍රේණියේ / I වන ශ්‍රේණියේ අදාළ තනතුරු දරණ නිලධාරීන්ගේ ජ්‍යෙෂ්ඨතා අනුපිළිවෙල අනුව පුරප්පාඩු සංඛ්‍යාව මෙන් දෙගුණයක් හෝ පස් (5) දෙනෙකු යන දෙකෙන් වැඩි සංඛ්‍යාවට සමාන සංඛ්‍යාවක් සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ.

ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.
ගොනු අංකය : GOS/ADM/12/7/372
දිනය : 2022.08.09

සටහන:
බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් උසස් කරනු ලබන නිලධාරීන් සේවා ස්ථාන වෙත අනුයුක්ත කිරීමේ දී ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ දී ලබා ගනු ලැබූ කුසලතා අනුපිළිවෙල අනුව අනුමත සේවක සංඛ්‍යාවේ පවතින පුරප්පාඩු සඳහා ඔවුනගේ කැමැත්තේ අනුපිළිවෙලට මනාප ලකුණු කිරීමට අවස්ථාව ලබා දී බඳවා ගනු ලැබේ.

7.4.4.1 වෘත්තීය පරීක්ෂණය : අදාළ නොවේ

7.4.4.2 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය: අදාළ නොවේ

7.4.4.3 යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය: අදාළ වේ

7.4.4.3.1 යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය පත්කරන බලධරයා: බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක්

7.4.4.3.2 ලකුණු දීමේ පරිපාටිය

| ලකුණු ලබා දෙනු ලබන ක්ෂේත්‍රය | ලබා දෙනු ලබන ලකුණු ප්‍රමාණය | සමත්වීම සඳහා සලකා බලනු ලබන ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| 01.සේවා පලපුරුද්ද | 60 | අදාල නොවේ |
| 02.අතිරේක අධ්‍යාපන සුදුසුකම් | 30 | |
| 03.විශේෂ කුසලතාවයන් | 10 | |
| එකතුව | 100 | |

ඉහත සඳහන් ලකුණු පරිපාටියට අදාලව සවිස්තරාත්මකව ලකුණු පරිපාටිය, අදාළ අයදුම්පත් කැඳවීමේ නිවේදනය අනුමත කරනු ලබන අවස්ථාවේදී පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ විසින් සකස් කර පළාත් සෞඛ්‍ය ලේකම් හා ප්‍රධාන ලේකම්ගේ නිර්දේශය සහිතව බස්නාහිර පළාත් කොමිෂන් සභාව වෙත යොමු කිරීමෙන් අනතුරුව බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලැබේ.

08. කාර්යක්ෂමතා කඩඉම් : අදාල නොවේ

09. භාෂා ප්‍රවීනතාවය : අදාල නොවේ

10. ශ්‍රේණි උසස් කිරීම : අදාල නොවේ

11. තනතුරුවලට පත් කිරීම : අදාල නොවේ

12. බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කමිෂන් සභා කාර්ය පටිපාටික රීති වල දැක්වෙන පොදු කොන්දේසි වලට පරිබාහිර වන්නා වූ කොන්දේසි :

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ විධිවිධාන වලට ද, බස්නාහිර පළාත් සභා මූල්‍ය රීති සංග්‍රහයට ද, කලින් කල බස්නාහිර පළාත් සභාවේ ගරු ආණ්ඩුකාරතුමා විසින් පනවනු ලබන රෙගුලාසි වලට නොහොත් නියෝගවලට ද, බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කලින් කලට පනවනු ලබන වෙනත් රෙගුලාසි නොහොත් නියෝග වලට ද, අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු නියෝග වලට ද අනුව කටයුතු කළ යුතු ය.

ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.
ගොනු අංකය : WPS/ADM/12/7/372
දිනය : 2022.08.09

13.බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කාර්ය පරිපාටික රීති සංග්‍රහයේ දැක්වෙන අර්ථ නිරූපණ වලට පරිබාහිර වන්නා වූ අර්ථ නිරූපණ:

බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කාර්ය පරිපාටික රීතිවල දැක්වෙන අර්ථ නිරූපණවලට පරිබාහිර වන්නා වූ අර්ථ නිරූපණ කිසිවක් වේනොත් ඒ සම්බන්ධයෙන් බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව/ බස්නාහිර පළාත් ගරු ආණ්ඩුකාරතුමා විමසා කටයුතු කරනු ඇත.

25 AUG 2022
14 FEB 2022

14. ශ්‍රේණි ක්‍රමයට අන්තර්ග්‍රහණය

මෙම පරිපාටිය ක්‍රියාත්මක වන දිනට සේවයේ යෙදී සිටින්නන්ට පමණක් අදාළ වේ. බඳවා ගැනීමේ පරිපාටිය ක්‍රියාත්මකවන දිනට රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2016 හා ඊට අනුෂාංගික චක්‍රලේඛ මගින් ලබා දී ඇති MT -08 වැටුප් ප්‍රමාණය යටතේ වැටුප් ලබන මෙම පරිපාටියේ සඳහන් තනතුරුවල නිලධාරීන් සියළු දෙනාම ආයතන සංග්‍රහයේ VII පරිච්ඡේදයේ 04 වන වගන්තියේ විධිවිධානවලට යටත්ව පහත සඳහන් පරිදි අන්තර්ග්‍රහණය කරනු ලැබේ.

සේවා කාලය ගණන් ගනු ලබන්නේ ඒ ඒ තනතුරට හෝ ශ්‍රේණියට පත් කරන ලද දිනය පදනම් කරගෙනය.කෙසේ වුවද අන්තර්ග්‍රහණය හේතුවෙන් අදාළ තැනැත්තාගේ වැටුප් වර්ධක දිනයෙහි වෙනසක් සිදු නොවිය යුතු අතර එම දිනය අන්තර්ග්‍රහණයට පෙර පැවති වැටුප් වර්ධක දිනය වශයෙන් නොවෙනස්ව ක්‍රියාත්මක විය යුතුය.එසේම වැටුප් පරිවර්තනයේ දී අදාළ තැනැත්තා අවසන් වරට ලබමින් සිටි වැටුප් පියවර නව වැටුප් පියවරට අනුරූපී වීම මත ආයතන සංග්‍රහයේ VII පරිච්ඡේදයේ 4.4 වගන්තිය අනුව ඊලඟ ඉහල වැටුප් පියවරේ තැබීම ද සිදු නොකල යුතුය.

14.1 (අ)මෙම බඳවා ගැනීමේ පරිපාටිය ක්‍රියාත්මක වන දිනටසේවයෙහි නියුතු වෛද්‍ය රසායනාගාර කාර්මික විද්‍යාඥ, ප්‍රාදේශීය වෛද්‍ය රසායනාගාර කාර්මික විද්‍යාඥ, ඖෂධවේදී, ප්‍රාදේශීය ඖෂධවේදීන්, විකිරණ ශිල්පි හා භෞත චිකිත්සක යන තනතුරුවල විශේෂ ශ්‍රේණියට අයත් නිලධාරීන් ප්‍රතිසංවිධිත වෛද්‍ය කර්මය සඳහා වූ පරිපූරක වෛද්‍ය වෘත්තීන්ගේ සේවාවේ විශේෂ ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කිරීම සිදු කරනු ලැබේ.

(ආ) සේවයේ විශේෂ ශ්‍රේණියේ තනතුරුවල සිටින නිලධාරීන් විශේෂ ශ්‍රේණියේ තනතුරුවල අන්තර්ග්‍රහණය හේතුකොටගෙන නියමිත දිනදී අදාළ පන්තිවල / ශ්‍රේණිවල ඒ ඒ නිලධාරීන්ට හිමිව පැවති ඔවුන්ගේ ජ්‍යෙෂ්ඨත්වයට හානියක් සිදු නොවනු ඇත.

15. මෙම පරිපාටියේ විධිවිධාන සලසා ඇති කරුණු සම්බන්ධව ගැටළු පැන නගින අවස්ථාවකදී හා/හෝ මෙම පරිපාටියේ විධිවිධාන සලසා නොමැති කරුණු සම්බන්ධයෙන් බස්නාහිර පළාත් ගරු ආණ්ඩුකාරතුමා විමසා තීරණය කරනු ඇත.

16. අර්ථ නිරූපණ

"සතුටුදායක සේවා කාලය":

(i) සතුටුදායක සේවයක් යනු නිලධාරියෙකු විසින් කාර්යක්ෂමව හා අනලස්ව රාජකාරි ඉටු කිරීම මගින්ද, සිදු කළ යුතුව තිබූ පත් වීම ස්ථිර කිරීම සඳහා අවශ්‍ය සුදුසුකම් සම්පූර්ණ කිරීම මගින්ද, එම කාලය තුළදී උපයා ගත යුතුව තිබූ සියළුම වැටුප් වර්ධක උපයාගෙන ඇත්තා වූ, සහ ඔහු විසින් දඬුවම් ලැබිය යුතු වරදක් සිදු නොකරන ලද්දා වූ කාල සීමාවක් වන්නේය.

(ii) නිලධරයා වෙත ලබා දිය යුතුව තිබූ වාර්ෂික වැටුප් වර්ධක නීත්‍යානුකූල හේතු මත අත්හිටුවා, අඩු කොට, නතර කොට හෝ විලම්භනය කොට ඇති කාල පරිච්ඡේදයක් වේ නම් එය ද, බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා විනය කාර්යය පරිපාටි සංග්‍රහය , ආයතන සංග්‍රහයේ II කොටසේ වැරදි පිළිබඳ පළමු උපලේඛණය යටතේ දඬුවම් ලැබිය හැකි වරදක් සිදු කොට ඇති විටක එම වරද සිදු කරනු ලැබූ දින සිට වසර තුනක කාලයක්ද, සහ බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා විනය කාර්යය පරිපාටි සංග්‍රහය, ආයතන සංග්‍රහයේ II කොටසේ වැරදි පිළිබඳ දෙවන උපලේඛනය යටතේ දඬුවම් ලැබිය හැකි වරදක් සිදු කොට ඇති විට එම වරද සිදු කළ දින සිට එක් වසරක කාලයක්ද, සතුටුදායක සේවා කාලය ගණනය කිරීමේදි බැහැර කළ යුතු වන්නේය.

ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.
ගොනු අංකය : GIOS/ADM/12/7/372
දිනය : 2022.06.09

**"සක්‍රීය සේවා කාලය":**

සක්‍රීය සේවා කාලය යනු ස්වකීය තනතුරට අදාළ වැටුප් ලබමින් සත්‍ය වශයෙන්ම රාජකාරියෙහි යෙදී සිටි සේවා කාලය වේ. රජයෙන් අනුමත ප්‍රසූත නිවාඩු හැර අනෙකුත් සියළුම වැටුප් රහිත නිවාඩු කාල පරිච්ඡේදයන් සක්‍රීය සේවා කාලය සඳහා ගණනය කරනු නොලබන්නේය.

17. අන්තර්කාලීන විධිවිධාන

මෙම බඳවා ගැනීමේ පරිපාටිය අනුමත වන දින සිට ඉදිරියට වසර 03ක් දක්වා අන්තර්කාලීන විධි විධාන ක්‍රියාත්මක වන අතර එම කාලය තුළ විශේෂ ශ්‍රේණියට/විශේෂ ශ්‍රේණියේ තනතුරුවලට උසස් කිරීම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අංක P/28/32/05/2009 හා 2009.04.16 දිනැති ලිපියෙන් අනුමත කර ඇති පහත සඳහන් ක්‍රමවේදයට සිදු කරනු ඇත.

**ලකුණු ලබා දීමේ ක්‍රමය**

ජ්‍යෙෂ්ඨත්වය - ලකුණු 60

මූලික සුදුසුකම් ඉක්මවූ 1 ශ්‍රේණියේ / අධි ශ්‍රේණියේ සෑම එක් වසරක සේවා කාලයක් සඳහා ලකුණු 05 බැගින් හිමිවේ.

කුසලතා - ලකුණු 40

ඇගයීම් කරනු ලබන දිනට ආසන්නතම,

| | |
|---|---|
| අඛණ්ඩ වසර 05ක සතුටුදායක සේවා කාලයක් සඳහා | - ලකුණු 40 |
| වසර 04ක සතුටුදායක සේවා කාලයක් සඳහා | - ලකුණු 32 |
| වසර 03ක සතුටුදායක සේවා කාලයක් සඳහා | - ලකුණු 24 |
| වසර 02ක සතුටුදායක සේවා කාලයක් සඳහා | - ලකුණු 16 |
| වසර 01ක සතුටුදායක සේවා කාලයක් සඳහා | - ලකුණු 08 |

සකස් කළේ - :................................

(විෂය භාර නිලධාරියා)

නම :එම්.ඒ.පි.පෙරේරා

තනතුර : කළමනාකරණ සහකාර

දිනය : 2021.10. 18

පරීක්‍ෂා කළේ - අත්සන.........................

(විෂය භාර මාණ්ඩලික නිලධාරියා)

: හංසනී හෙට්ටිආරච්චි

තනතුර: නියෝජ්‍ය අධ්‍යක්ෂ (පාලන)

දිනය: 2021.10. 18

නිර්දේශ කර ඉදිරිපත් කරමි.

අත්සන : ..........................................

(දෙපාර්තමේන්තු ප්‍රධානියා)

නම : වෛද්‍ය ධම්මිකා ජයලත්

තනතුර : බස්නාහිර පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ

දිනය : 2021.10 28

නිල මුද්‍රාව

ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.

ගොනු අංකය : GOS/ADM/12/7/372

දිනය : 2022-08-09

යොමු අංකය : WPH/AS/5/12

25 AUG 2022

14 FEB 2022

බස්නාහිර පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවෙහි වෛද්‍ය කර්මය සඳහා වූ පරිපූරක වෘත්තීන්ගේ සේවාවෙහි වෛද්‍ය රසායනාගාර කාර්මික විද්‍යාඥ, ඖෂධවේදී, විකිරණ ශිල්පී හා භෞත චිකිත්සක විශේෂ ශ්‍රේණියේ තනතුරු සඳහා යෝජිත මෙම බඳවා ගැනීමේ පරිපාටිය අනුමත කිරීම නිර්දේශ කරමි.

අත්සන ..............................

නම: එච්.ජී.ජී.ජේ. ධර්මසේන,
ලේකම්,
සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුභසාධන
පරිවාස හා ළමාරක්ෂක සේවා, කාන්තා
කටයුතු සහ සභා කටයුතු අමාත්‍යාංශය(බ.ප)

දිනය : 2021.11.02

නිල මුද්‍රාව :

එච්. ජී. ජී. ජේ. ධර්මසේන
ලේකම්
සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුබසාධන,
පරිවාස හා ළමාරක්ෂක සේවා, කාන්තා කටයුතු
සහ සභා කටයුතු අමාත්‍යාංශය
බස්නාහිර පළාත

යොමුඅංකය : CSWP/PTR/23-3/F1/9

බස්නාහිර පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවෙහි වෛද්‍ය කර්මය සඳහා වූ පරිපූරක වෘත්තීන්ගේ සේවාවෙහි වෛද්‍ය රසායනාගාර කාර්මික විද්‍යාඥ, ඖෂධවේදී, විකිරණ ශිල්පී හා භෞත චිකිත්සක විශේෂ ශ්‍රේණියේ තනතුරු සඳහා යෝජිත මෙම බඳවා ගැනීමේ පරිපාටිය අනුමත කිරීම නිර්දේශ කරමි.

අත්සන :..............................
නම :..............................
ප්‍රධාන ලේකම් (බ.ප)

දිනය :.2022.01.31

නිල මුද්‍රාව:

ජේ. එම්. සී. ජයන්ති විජේතුංග
ප්‍රධාන ලේකම් (බස්නාහිර පළාත)
ප්‍රධාන ලේකම් කාර්යාලය (බ.ප.)
204, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
බත්තරමුල්ල

යොමු අංකය :..............................

බස්නාහිර පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවෙහි වෛද්‍ය කර්මය සඳහා වූ පරිපූරක වෘත්තීන්ගේ සේවාවෙහි වෛද්‍ය රසායනාගාර කාර්මික විද්‍යාඥ, ඖෂධවේදී, විකිරණ ශිල්පී හා භෞත චිකිත්සක විශේෂ ශ්‍රේණියේ තනතුරු සඳහා යෝජිත මෙම බඳවා ගැනීමේ පරිපාටිය අනුමත කිරීම නිර්දේශ කරමි.

අත්සන :..............................
නම :..............................
ලේකම්
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව (බ.ප)

දිනය 2022.07.25

නිල මුද්‍රාව :

තිලක් සෙනරත්
ලේකම්
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව
බස්නාහිර පළාත

ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.
යොමු අංකය : GOS/ADM/12/7/372
දිනය : 2022.08.09

යොමුඅංකය : GOS/ADM/12/7/372

බස්නාහිර පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවෙහි වෛද්‍ය කර්මය සඳහා වූ පරිපූරක වෘත්තීන්ගේ සේවාවෙහි වෛද්‍ය රසායනාගාර කාර්මික විද්‍යාඥ, ඖෂධවේදී, විකිරණ ශිල්පී හා භෞත චිකිත්සක විශේෂ ශ්‍රේණියේ තනතුරු සඳහා වන මෙම බඳවා ගැනීමේ පරිපාටිය 2022.08.09 දින ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.

අත්සන :

නම : පී. සෝමසිරි
ආණ්ඩුකාර ලේකම්

ආණ්ඩුකාර ලේකම් (බ.ප)

නිල මුද්‍රාව

දිනය 2022.08.09

ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.
යොමු අංකය : GOS/ADM/12/7/372
දිනය : 2022.08.09

25 AUG 2022

ඇමුණුම - 01

14 FEB 2022

සේවා ගණයට අයත් තනතුරු

අනුමත තනතුරු නාමය අනුමත තනතුරු සංඛ්‍යාව හා ඒවාට පැවරෙන කාර්යයන්

| අනුමත තනතුරු නාම | අනුමත තනතුරු සංඛ්‍යාව | තනතුර අනුමත ශ්‍රේණිය | කාර්යයන් |
|---|---|---|---|
| විශේෂ ශ්‍රේණියේ වෛද්‍ය රසායනාගාර කාර්මික විද්‍යාඥ | 04 | විශේෂ ශ්‍රේණිය | III,IIහාI ශ්‍රේණියේ නිලධාරින්ට අදාළ කාර්යයන් අධීක්ෂණය කිරිම, ඔවුන්ගේ කාර්ය සාධනය ඇගයීම ,ඔවුන්ට අවශ්‍ය පුහුණුව ලබා දීම, ඔවුන්ගේ රාජකාරි පිළිබඳ ප්‍රතිපත්ති සැලසුම් කිරීමේ දී සහය වීම, අදාළ උපදෙස් හා තොරතුරු ලබා දීම හා තනතුරට අදාළ වෙනත් රාජකාරි කටයුතු. |
| විශේෂ ශ්‍රේණියේ ප්‍රාදේශීය වෛද්‍ය රසායනාගාර කාර්මික විද්‍යාඥ | 01 | විශේෂ ශ්‍රේණිය | ඉහත කරුණු වලට අමතරව සියළුම ශ්‍රේණිවල නිලධාරීන් පොදු චක්‍රලේඛ අංක 02-17/2006 මගින් පැවරෙන කාර්යයන් වලටද යටත් වේ. |
| විශේෂ ශ්‍රේණියේ ඖෂධවේදී | 06 | විශේෂ ශ්‍රේණිය | III,IIහාI ශ්‍රේණියේ නිලධාරින්ට අදාළ කාර්යයන් අධීක්ෂණය කිරිම, ඔවුන්ගේ කාර්ය සාධනය ඇගයීම ,ඔවුන්ට අවශ්‍ය පුහුණුව ලබා දීම, ඔවුන්ගේ රාජකාරි පිළිබඳ ප්‍රතිපත්ති සැලසුම් කිරීමේ දී සහය වීම, අදාළ උපදෙස් හා තොරතුරු ලබා දීම<br>ඉහත කරුණු වලට අමතරව සියළුම ශ්‍රේණිවල නිලධාරීන් පොදු චක්‍රලේඛ අංක 02 -83 /98 මගින් පැවරෙන කාර්යයන් හා තනතුරට අදාළ වෙනත් රාජකාරි කටයුතු. |
| ප්‍රාදේශීය ඖෂධවේදී | 03 | විශේෂ ශ්‍රේණිය | බස්නාහිර පළාත් සෞඛ්‍ය, දේශීයවෛද්‍ය, සමාජ සුභසාධන කටයුතු ස සහා කටයුතු අමාත්‍යාංශය තුළ ඖෂධවේදීන් සම්බන්ධ කටයුතු වලදී සම්බන්ධීකරණය කිරිම හා සහය දීම හා තනතුරට අදාළ වෙනත් රාජකාරී කටයුතු |
| විශේෂ ශ්‍රේණියේ විකිරණ ශිල්පී | 01 | විශේෂ ශ්‍රේණිය | III,IIහාI ශ්‍රේණියේ නිලධාරින්ට අදාළ කාර්යයන් අධීක්ෂණය කිරිම, ඔවුන්ගේ කාර්ය සාධනය ඇගයීම ,ඔවුන්ට අවශ්‍ය පුහුණුව ලබා දීම, ඔවුන්ගේ රාජකාරි පිළිබඳ ප්‍රතිපත්ති සැලසුම් කිරීමේ දී සහය වීම, අදාළ උපදෙස් හා තොරතුරු ලබා දීම හා තනතුරට අදාළ වෙනත් රාජකාරි කටයුතු |

ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.
ගොනු අංකය : GOS/ADM/12/7/372
දිනය : 2022.08.09

| | | | |
|---|---|---|---|
| විශේෂ ශ්‍රේණියේ ෛවද්‍ය විකිත්සක | 01 | විශේෂ ශ්‍රේණිය | අදාළ තනතුරේ III,II,I හා අධි ශ්‍රේණියේ නිලධාරින්ට අදාළ කාර්යයන් අධීක්ෂණය කිරිම, ඔවුන්ගේ කාර්ය සාධනය ඇගයීම ,ඔවුන්ට අවශ්‍ය පුහුණුව ලබා දීම, ඔවුන්ගේ රාජකාරි පිළිබඳ ප්‍රතිපත්ති සැලසුම් කිරිමේ දී සහය වීම, අදාළ උපදෙස් හා තොරතුරු ලබා දීම හා තනතුරට අදාළ වෙනත් රාජකාරි කටයුතු . |

සකස් කළේ - :.................................

(විෂය භාර නිලධාරියා)

නම :එම්.ඒ.පි.පෙරේරා

තනතුර : කළමනාකරණ සහකාර

දිනය : 2021.10. 18

පරීක්ෂා කළේ - අත්සන.........................

(විෂය භාර මාණ්ඩලික නිලධාරියා)

: හංසනී හෙට්ටිආරච්චි

තනතුර: නියෝජ්‍ය අධ්‍යක්ෂ (පාලන)

දිනය: 2021.10 . 18

නිර්දේශ කර ඉදිරිපත් කරමි.

අත්සන : ..............................................

(දෙපාර්තමේන්තු ප්‍රධානි)

නම : වෛද්‍ය ධම්මිකා ජයලත්

තනතුර : බස්නාහිර පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ

දිනය : 2021.10 28

නිල මුද්‍රාව

ගරු: [illegible] විසින් අනුමත කරන ලදී.

යොමු අංකය : GOS/ADM/12/7/372

දිනය : 2022.08.09

ඇමුණුම : 02

ශ්‍රේණි උසස් වීම් ලබාගැනීම සඳහා වූ අයදුම්පත

25 AUG 2022

14 FEB 2022

Provincial Public Service

1. නිලධරයා පිළිබඳ තොරතුරු

1.1 අයදුම්කරුගේ සම්පූර්ණ නම : ..........

1.2 හැඳුනුම්පත් අංකය : ..........

1.3 සේවා ස්ථානය සහ එහි ලිපිනය : ..........

1.4 අයත් වන සේවය හා තනතුර : ..........

1.5 අයත්වන සේවා ශ්‍රේණිය හා ශ්‍රේණිය : ..........

2. පත්වීම පිළිබඳ තොරතුරු

2.1 පත්වීම් දිනය : ..........

2.2 පත්වීම ස්ථිර කළ දිනය : ..........

2.3 සමත් වූ කාර්යක්ෂමතා කඩඉම හා සමත් දිනය :

| සමත් වූ කාර්යක්ෂමතා කඩඉම | සමත්විය යුතු දිනය | සමත් වූ දිනය |
|---|---|---|
| | | |

2.4 සමත් වූ භාෂා ප්‍රවීණතා මට්ටම හා සමත් දිනය :

| සමත් වූ භාෂා ප්‍රවීණතා මට්ටම | සමත්විය යුතු දිනය | සමත් වූ දිනය |
|---|---|---|
| | | |

3. උසස්වීමට අදාළ තොරතුරු

3.1 උසස්වීමට අපේක්ෂිත ශ්‍රේණිය : II / I / අධි

3.2 උසස්වීමට අපේක්ෂිත ධාරාව : සාමාන්‍ය /සුවිශේෂී

3.2.1 අවශ්‍ය සක්‍රිය සේවා කාලය සම්පූර්ණ කර තිබේද? ඔව් / නැත

3.2.2 සක්‍රිය සේවා කාලය සම්පූර්ණ කළ දිනය ..........

3.2.3 අපේක්ෂිත සක්‍රිය සේවා කාලය තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට අදාළ මට්ටමේ කාර්ය සාධනයක් පෙන්නුම් කරතිබේද? ඔව් / නැත

3.2.4 නියමිත වැටුප් වර්ධක සියල්ල උපයාගෙනතිබේද? ඔව් / නැත

උසස්වීමට පූර්වාසන්න පස් වසර තුළ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබේද? ඔව් / නැත

3.2.5 විනය දඬුවම් ලබා තිබේද? ඔව් / නැත

ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.
ගොනු අංකය : ..ගොස/ADM/12/7/372..
දිනය : 2022.08.09

4 අයදුම්කරුගේ ප්‍රකාශය

ඉහත සඳහන් සියලු තොරතුරු සත්‍ය හා නිවැරදි බවත් ,මා හට විරුද්ධව නොනිමි විනය පරීක්ෂණයක් නොමැති බවත් ............................ දින සිට සාමාන්‍ය කාර්ය සාධනය / සුවිශේෂී කාර්ය සාධනය යටතේ II / I / විශේෂ ශ්‍රේණියට උසස්වීමට අදාළ සුදුසුකම් සපුරා ඇති බවත් සහතික කරමි.

දිනය : ............................................ ..............................................................................

නිලධරයාගේ අත්සන

5. <u>දෙපාර්තමේන්තු ප්‍රධානිගේ නිර්දේශය</u>

ඉහත සඳහන් සියලු තොරතුරු සත්‍ය හා නිවැරදි බවත් ,ඉහත නම් සඳහන් ............................................. මහතා / මිය / මෙනවිය ............................ සේවා ගණයේ ..........................ශ්‍රේණියට සාමාන්‍ය කාර්ය සාධනය / සුවිශේෂී කාර්ය සාධනය යටතේ උසස් කිරීම සඳහා වූ සියලු කරුණු සම්පූර්ණ කර ඇති බවටත්, සෑහීමකට පත්වෙමි.ඒ අනුව එම නිලධරයා ඉහත ශ්‍රේණියට උසස් කිරීම නිර්දේශ කරමි.

අත්සන : ..........................................................

නිල මුද්‍රාව : ....................................................

6. <u>අමාත්‍යාංශ ලේකම්ගේ නිර්දේශය</u>

දෙපාර්තමේන්තු ප්‍රධානි විසින් ඉහතින් දක්වා ඇති කරුණු නිවැරදි බවත් /නිවැරදි නොවන බවත් ,ඒ අනුව ඉහත නිර්දේශ හා එකඟ වන බවත් / නොවන බවත්, කාරුණිකව දන්වමි.

අත්සන : ..........................................................

නිල මුද්‍රාව : ....................................................

7. <u>ප්‍රධාන ලේකම්ගේ නිර්දේශය</u>

ඉහත සඳහන් සියලු තොරතුරු සත්‍ය හා නිවැරදි බවත්,ඒ අනුව ........................................................... මහතා / මිය / මෙනවිය ............................ සේවා ගණයේ ..........................ශ්‍රේණියට සාමාන්‍ය කාර්ය සාධනය / සුවිශේෂී කාර්ය සාධනය යටතේ .............................. දින සිට උසස් කිරීම නිර්දේශ කර ඉදිරිපත් කරමි.

අත්සන : ..........................................................

නිල මුද්‍රාව : ....................................................

සකස් කළේ - :..................................
(විෂය භාර නිලධාරියා)
නම :එම්.ඒ.පි.පෙරේරා
තනතුර : කළමනාකරණ සහකාර
දිනය : 2021.10.18
නිර්දේශ කර ඉදිරිපත් කරමි.

පරීක්ෂා කළේ - අත්සන.................................
(විෂය භාර මාණ්ඩලික නිලධාරියා)
: හංසනී හෙට්ටිආරච්චි
තනතුර: නියෝජ්‍ය අධ්‍යක්ෂ (පාලන)
දිනය: 2021.10.18

අත්සන : ..............................................
(දෙපාර්තමේන්තු ප්‍රධානී)

නම : වෛද්‍ය ධම්මිකා ජයලත්
තනතුර : බස්නාහිර පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ
දිනය : 2021.10 28
නිල මුද්‍රාව

කරු. ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.
ගොනු අංකය : GOS/ADM/12/7/372
දිනය : 2022.08.09